සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 6 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

01. සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන,

(i) 30 කි. (ii) 32 කි. (iii) 54 කි. (iv) 60 කි.

02. 'කොම්බුව සහ දීර්ඝත්ව සලකුණ' යෙදුණු වචනය තෝරන්න.

(i) පොත (ii) බෝලය (iii) මේසය (iv) බෙල්ල

03. උක්ත පදයක් සහ අනුක්ත පදයක් ඇති පිළිතුර තෝරන්න.

(i) ගුරුවරයෙක්, ළමයි (ii) සිංහයන්, සතුන්
(iii) තොපි, අපි (iv) ගවයෙක්, කුරුල්ලෙකු

04. ප්‍රථම පුරුෂ බහු වචන අතීත කාල ක්‍රියා පදයකි,

(i) බලමු (ii) බැලුවෙහි (iii) බැලෙති (iv) බැලුවෝ ය.

05. 'විදුහල්පතිතුමා දක්ෂ දරුවන් අගය කළේ ය.' යන වාක්‍යයේ උක්ත පදය වන්නේ,

(i) දක්ෂ (ii) විදුහල්පතිතුමා (iii) දරුවන් (iv) කළේ ය.

- අංක 06 සිට 07 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල සමානාර්ථවත් පදය තිත් ඉර මත ලියන්න.

06. දිවාකර - ..............................................................................

07. වල - ..............................................................................

- **අංක 08 සිට 09 ප්‍රශ්නවල දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පදයක් බැගින් තිත් ඉර මත ලියන්න.**

08. දොම්නස - ............................................................................

09. දුදන - ............................................................................

- **අංක 10 සිට 13 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

10. මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචනය,

(i) ගඟ (ii) දඹළ (iii) භක්තිය (iv) විශේෂ

11. සඤ්ඤක අක්ෂරයක් වන්නේ,

(i) ණ ය. (ii) ෂ ය. (iii) ළ ය. (iv) ඤ ය.

12. 'ළමයා උස ගසට නැග අඹ කැඩුවේ ය.'' යන වාක්‍යයේ ඇතුළත් නාම විශේෂණ පදය වන්නේ,

(i) ගසට ය. (ii) උස ය. (iii) ළමයා ය. (iv) අඹ ය.

13. 'දෝලාව' යන වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදිව යෙදුණු පිළිතුර,

(i) ද් + ඔ + ල් + අ + ව් + අ (ii) ද් + ඒ + ල් + ආ + ව් + අ

(iii) ද් + ඕ + ල් + අ + ව් + අ (iv) ද් + ඕ + ල් + ආ + ව් + අ

- **අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.**

14. (i) ස්තානය (ii) ගංඟාව (iii) ඡන්දය (iv) සංගයා

15. (i) අප්‍රානික (ii) යෝධයා (iii) නිලදාරියා (iv) පනිවිඩය

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස් තැන්වලට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

16. ............................................................................ (වෛද්‍යවරයා / වෛද්‍යවරු) සේවයට වාර්තා කළහ.

17. ............................................................................ (සිසුන් / සිසුහු ) ග්‍රහලෝකාගරය නැරඹූහ.

18. කුරුල්ලෙක් පියාඹා ............................................................................ (ගියේ ය. / ගියහ.)

19. ක්‍රීඩකයා තරග බිමට ප්‍රවේශ ............................................................................ (වෙති. / වෙයි.)

20. පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉර මත ලියන්න.

මෙච්චරඉනිගොඩක්මංකොහොමදතනිවමඋස්සාගෙනයන්නේඔහුකල්පනාකළේය.

............................................................................................................................

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

- **ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **1, 2, 3 ප්‍රශ්න අනිවාර්ය වන අතර 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය කුමක් ද?

(ii) පහත ඒක වචන නාම පදවල බහුවචනය ලියන්න.

ලේනා - ..........................................     පහන - ........................................................

මුවා - ..........................................     නිවාසය - ........................................................

(iii) පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

උදයම පුබු දී

මුහුණට දිය දී

..........................................................................................

..........................................................................................

(iv) කුමාරතුංග මුනිදාස මහතා ළමයින් සඳහා රචනා කරන ලද ගද්‍ය කෘති දෙකක් ලියන්න.

(v) ''බොඩගහ වළ නමින් දන්නා මහ දිය වළක් මේ ඔය ඉවුරේ විය.''

ඉහත උද්ධෘතය උපුටාගත් පාඩමේ නම ලියන්න.

(ලකුණු 2 × 5 , 10)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.

(i) සිංහල අලුත් අවුරුද්ද.

(ii) පොත් කියවමු. දැනුම ලබමු.

(iii) ජල සම්පත සුරකිමු.

(iv) වැඩිහිටි ඔවදන් පිළිපදිමු.

(v) ගංගාවක් කතා කරයි.

(ලකුණු 20)

03. පහත අවස්ථා අතරින් එකකට පිළිතුරු ලියන්න.

ඔබ පියාගේ උපන් දිනය වෙනුවෙන් පියාට යවන සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

**නැතහොත්**

ඔබේ පියාගේ උපන් දිනය දා පවුලේ සාමාජිකයන් ළමා නිවාසයකට දානයක් ලබා දෙන බව දැනුම්වත් කරමින් එයට සහභාගීවන ලෙස ඉල්ලමින් ඔබේ හොඳ ම මිතුරාට යවන ලිපිය ලියන්න.

(ලකුණු 10)

04. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

පොඩි ගමරාල පමණක් නොව වෙනත් ගැමියෝ ද අපේ දූපතට එන්ට වූහ. ඇතැම් දවසක ගඟේ සෙල්ලම් පිණිස, යාත්‍රා කිරීමටත්, මාළු බෑමටත් කොළඹින් පැමිණි පිරිමිනුත්, ගැහැනුත්, ළමයිනුත්, මඩොල් දූවට ගොඩ බැස, එහි දී දවල් කෑම කා ගියෝ ය. අප දැන හැඳින ගත් ඔවුහු බොහෝ සන්තෝෂ වූහ. ඇතැමෙක් කොළඹට එන්න යයි අපට ආරාධනා කළෝ ය. මඩොල් දූව වගා කිරීම ගැන කවුරුත් අපට ප්‍රශංසා කළහ. වරක් ගාල්ලේ පෙරකදෝරුවකුත්, ඔහුගේ බිරිඳ සහ දුවත් පුතාත් මඩොල් දූවට පැමිණියේ පොඩි ගමරාල සමඟ ය. අපි එදින බත් උයා මයියොක්කා තම්බා පොල් සම්බලයක් සාදා කුම්බලා කරවල උයා එයින් ඔවුන්ට සංග්‍රහ කළෙමු.

(i) පොඩි ගමරාලට අමතරව දූපතට පැමිණියේ කවුරු ද?

(ii) ගඟේ සෙල්ලම් පිණිස කළ ක්‍රියාකාරකම් මොනවා ද?

(iii) කොළඹින් පැමිණි පිරිස මඩොල් දූවට ගොඩ බැස්සේ ඇයි ?

(iv) පොඩි ගමරාල සමඟ පැමිණි අය කවු ද?

(v) ඔවුන්ට සංග්‍රහ කළේ මොනවායින් ද?

(ලකුණු 2 × 5 = 10)

05. පහත සඳහන් ප්‍රකාශ කළේ කවු ද, කාට ද යන්න ලියන්න.

(i) ''හා, හා, මම එහෙමත් කරනව ද?''

(ii) ''හනික, හනික, බලා ඉන්න කල් නෑ''

(iii) ''ළිප ළඟට ගොස් ළිපෙන් ගිනි පෙනෙල්ලක් අරගෙන යන්ට''

(iv) ''ගොඩින් පැන ගත්තා - හුගක් ළඟ හින්දා''

(v) ''අම්මාව එක්ක යන්නේ මම''

(ලකුණු 2 × 5 = 10)

06. පහත වාක්‍ය අතීතකාලයට හරවා ලියන්න.

(i) ක්‍රීඩකයා තරගය ජයග්‍රහණය කරයි.

(ii) අපි ප්‍රදර්ශනය නැරඹීමට යමු.

(iii) කිරිල්ලිය කෑම සොයා පියඹයි.

(iv) තෝ ගමට යහි.

(v) ගොවියෝ නිසි කලට ගොවිතැන් කරති.

(ලකුණු 2 × 5 = 10)

07. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ජනශ්‍රැතියට අයත් අංග 02 ක් ලියන්න.

(ii) ''අපේ ගම'' කෘතියේ කතුවරයා කවු ද?

(iii) ජාතක පොතෙහි ඇතුළත් කතා ගණන කීය ද?

(iv) ''මාස්ටර්මන් රෙඩි'' නැමැති ඉංග්‍රීසි නවකතාව ඇසුරින් ළමයින් සඳහා ලියන ලද සිංහල නවකතාව කුමක් ද?

(v) 'උදය සිරි' පැදි පෙළ රචනා කළේ කවු ද?

(ලකුණු 2 × 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iv (02) iii (03) iv (04) iv (05) ii (06) දිනමිණ, දිනිසුරු, ඉර, සූර්යයා.....
(07) කැලෑව, අරණ, වනය.... (08) සොම්නස (09) සුදන (10) iii
(11) iii (12) ii (13) iv (14) iii (15) ii (16) වෛද්‍යවරු (17) සිසුහු
(18) ගියේ යත (19) වෙයි (20) ''මෙච්චර ඉනි ගොඩක් මං කොහොම ද තනිව ම උස්සාගෙන යන්නේ ?'' ඔහු කල්පනා කළේ ය. (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) අ (ii) ලේන්නු, පහන්, මුවෝ, නිවාස
(iii) කුලදෙවි නම දී ගේ දොර හම දී (iv) හත්පණ, හීන්සැරය, මඟුල් කෑම
(v) වීවෙං වුලගෙං යමු කිරි නෑනෝ
(ලකුණු 2 × 5 = 10)

02. කරුණු, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා ඇගයීමට ලක් කරමින් ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 20) (6, 10, 4 ලෙස පිළිවෙළින් ලකුණු ප්‍රදානය කරන්න.)

03. ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා සලකා ලකුණු ප්‍රදානය කරන්න. මුළු ලකුණු 10 කි. පිළිවෙළින් 3, 5, 2 ලෙස ලකුණු ලබා දෙන්න.

04. (i) වෙනත් ගැමියෝ / ගැමියන්
(ii) යාත්‍රා කිරීම, මාළු බෑම.
(iii) දහවල් කෑම කෑමට / දිවා ආහාරය ගැනීමට / දහවල් බත් කන්න / කෑමට.
(iv) පෙරකදෝරුවෙකු, ඔහුගේ බිරිඳ, දුව, පුතා
(v) බත්, මයියොක්කා, පොල් සම්බෝල, කුම්බලා කරවල (දෙකක් ලියා ඇත්නම් 01 ලකුණක් දෙන්න.)
(ලකුණු 2 × 5 = 10)

05. (i) ඉබ්බා, මානකොක්කු, දෙදෙනාට / දෙන්නාට.
(ii) පොරමලා, ගමා හා කයිරාට
(iii) රාස්සිය, යකඩතිස්ස කුමාරයාට.
(iv) කපුරාල, නරියාට
(v) ශරත්, පියදාසට (ලකුණු 2 × 5 = 10)

06. (i) ක්‍රීඩකයා තරගය ජයග්‍රහණය කළේ ය.
(ii) කිරිල්ලිය කෑම සොයා පියෑඹුවා ය.
(iii) තෝ ගමට ගියෙහි.
(iv) ගොවියෝ නිසි කලට ගොවිතැන් කළහ. / කළෝ ය. (ලකුණු 2 × 5 = 10)

07. (i) ජනකතා, ජනකවි, පිරුළු, ජන නාටක, උපහැරණ
(ii) මාර්ටින් වික්‍රමසිංහ මහතා
(iii) 547
(iv) රණරාල
(v) එස්. මහින්ද හිමි / සිකීම් මහින්ද හිමි / ඇස්. මහින්ද හිමි (ලකුණු 2 × 5 = 10)